# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1797/27 - 2013 පෙබරවාරි මස 15 වැනි සිකුරාදා - 2013.02.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත**

6 වගන්තිය යටතේ නියෝගය

**සේවා සැපයුම්කරුවන් පත් කිරීම**

2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 6 වැනි වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව සිවිල් ගුවන්සේවා අමාත්‍ය පියංකර ජයරත්න වන මම ඉහත පනත යටතේ වර්ෂ 2011 ඔක්තෝබර් මස 13 වැනි දින අංක 1727/12 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයෙහි පලකළ නියමය ප්‍රකාර පත් කරනු ලැබූ ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු මෙහි පහත I වැනි උපලේඛනයෙහි සඳහන් නියමයන් හා කොන්දේසි ප්‍රකාරව, මෙහි පහත II වැනි උපලේඛනයෙහි සඳහන් ගගන නාවික සේවාවන් සැපයීම සඳහා සේවා සැපයුම්කරුවකු ලෙස පත් කරනු ලැබූ බව මෙම නියෝගයෙන් පල කරමි.

පියංකර ජයරත්න,<br>සිවිල් ගුවන්සේවා අමාත්‍ය.

2013 පෙබරවාරි මස 14 වැනි දින.

*උපලේඛනය I*

*පත්කිරීම සඳහා වන නියමයන් හා කොන්දේසි*

1. මෙහි II වැනි උපලේඛනයෙහි සඳහන් ගගන නාවික සේවා සැපයීමේදී ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින් 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ අදාල වන නීති ප්‍රතිපාදනයන්ටත්, එම පනත යටතේ පනවනු ලබන රීති, රෙගුලාසි සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන්ටත් අනුව කටයුතු කළ යුතු ය.

2. ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින් තම සේවා සැපයීමට අදාලව කලින් කලට අමාත්‍යවරයා විසින් දෙනු ලබන සාමාන්‍ය සහ විශේෂ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ යුතු ය.

3. ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින් රජය වෙනුවෙන් දරනු ලබන චංචල හා නිශ්චල දේපල ගුවන් ප්‍රවාහන කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් යථා පරිදි පවත්වාගෙන යායුතු අතර, එකී නිශ්චල දේපල අවුරුදු 10කට වඩා වැඩි කාලයක් සඳහා තුන්වන පාර්ශවයකට බදු දීම අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ ලේකම්වරයාගේ පූර්ව ලිඛිත අවසරය නොමැතිව සිදු නොකළ යුතු ය.

4. මෙහි සඳහන් දිනෙන් පසුව ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින් සපයනු ලබන ගගන නාවික සේවා සම්බන්ධව එළඹෙනු ලබන ගිවිසුම්, එම ගිවිසුමේ මෙයට පරස්පර විරෝධි ප්‍රතිපාදන ඇත්නම් හැර, ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින් එකී ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු වෙනුවෙන් ඇති කර ගන්නා ලද ගිවිසුම් ලෙස සලකනු ලබන බවට හැර, එකී ගිවිසුම් කිසිවිටෙකත් රජය වෙනුවෙන් හෝ රජය එකී ගිවිසුම් කෙරෙහි බැඳ තැබීමක් සිදු නොවනු ඇත.

5. අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ ලේකම්වරයාගේ ලිඛිත ඉල්ලීම මත ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින් සපයනු ලබන ගගන නාවික සේවාවන්ට අදාල පරිපාලන, මෙහෙයුම්, තාක්ෂණික හා මූල්‍යමය තොරතුරු එකී ලේකම් වෙත සැපයිය යුතු ය.

6. ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින් සපයනු ලබන සේවාවන් ඊට අදාළ අන්තර්ජාතික ප්‍රමිතීන්ට හා නිර්දේශිත ක්‍රියාදාමයන්ට අනුව සැපයීම උදෙසා ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් හෝ සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂක ජනරාල් මගින් අදාල අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, II වැනි උපලේඛනයෙහි සඳහන් ගගන නාවික සේවා වෙනුවෙන් අදාල බලපත්‍ර හෝ අවසරපත්‍ර ලබා ගත යුතු ය.

7. ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින් අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව මෙහි පහත II වන උපලේඛනයෙහි සඳහන් ගගන නාවික සේවාවන් සැපයීම, වෙනස් කිරීම, තාවකාලිකව හෝ ස්ථිරව නැවැත්වීම සිදු නොකළ යුතු ය.

8. මෙහෙයුම් අවස්ථාවන් වලදී දැරීමට සිදුවන වගකීම් සහ වන්දි වෙනුවෙන් රජයට වගකීම් නොපැවරෙන පරිදි සුදුසු රක්ෂණ ආවරණ ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින් ලබා ගත යුතු ය.

9. ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරුගේ ව්‍යවස්ථාපිත හඳුනා ගැනීම, කොටස් ප්‍රාග්ධනය හෝ නම වෙනස් කිරීම සඳහා අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතු ය.

10. ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින් අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව මෙහි පහත II වැනි උපලේඛනයෙහි සඳහන් කිසිදු ගගන නාවික සේවාවක් පැවරීම හෝ අතුරු බඳු දීමක් නොකළ යුතු ය.

## උපලේඛනය II

*ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින් සපයනු ලබන ගගන නාවික සේවා*

1. i. බස්නාහිර පළාතේ පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල, කොළඹ
   ii. දකුණු පළාතේ පිහිටි මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල
   iii. බස්නාහිර පළාතේ පිහිටි කොළඹ ගුවන්තොටුපල, රත්මලාන සහ අමාත්‍යවරයා විසින් කලින් කලට පළකරනු ලබන ගැසට් නිවේදන මඟින් සඳහන් කරනු ලබන අනෙකුත් ගගන යාත්‍රාංගන සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.

2. ඉහත (I) හි සඳහන් ගගන යාත්‍රාංගනයන්හි සහ අමාත්‍යවරයා විසින් කලින් කලට පළ කරනු ලබන ගැසට් නිවේදන මඟින් සඳහන් කරනු ලබන අනෙකුත් ගගන යාත්‍රාංගනයන්හි සෝදිසි කිරීමේ, මුදා ගැනීමේ සහ ගිනි නිවීමේ සේවාවන් සැපයීම සහ පවත්වාගෙන යාම.

3. ඉහත (I) හි සඳහන් ගගන යාත්‍රාංගනයන්හි සහ අමාත්‍යවරයා විසින් කලින් කළට පළ කරනු ලබන ගැසට් නිවේදන මඟින් සඳහන් කරනු ලබන අනෙකුත් ගගන යාත්‍රාංගනයන්හි ගුවන් සේවා ආරක්ෂක සේවාවන් සැපයීම සහ පවත්වාගෙන යාම.

4. ගුවන් ගමන් සේවා සැපයීම.

5. ගගන නාවික තොරතුරු සේවා සැපයීම.

6. ගගන නාවික සංදේශන සේවා සැපයීම.

7. සංදේශනය, ගුවන් සංතරණය සහ සෝදිසිය සඳහා ගගන නාවික ආධාරක සැපයීම.

03-266

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත හැක.*